**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 ව්‍යාපෘතිය - 2018**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V පරිච්ඡේදය යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3029-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV පරිච්ඡේදයේ 4.05 වගන්තිය සහ 3030 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV පරිච්ඡේදයේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 කට සමාන එජඩො මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 කට සමාන එජඩො මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එජඩො මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එජඩො මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

-

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරික්ෂණය කෙරේ.

| අනු අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ණය ලබාදෙන ආයතනය විසින් මෙම වැඩසටහනෙන් අයකරගත් එකතුව එ.ජ.ඩො. 997,059 කට සමාන රු. මිලියන 157.58 ක් වූ බැඳීම් ගාස්තු සහ පොළිය කොළඹ මහනගර සභාව විසින් ක්‍රියාවට නංවන ලද මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන වැඩ වැඩසටහන 2 නැමති ව්‍යාපෘති කොටසෙන් වෙන්කර ගිණුම් වලට ගෙන නොතිබුණි | පොළී හා බැඳීම් ගාස්තු අඩු වෙන් දැක්වීම. | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උපදෙස් පරිදි, පොළී හා බැඳීම් ගාස්තු ගිණුම් ගත කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ සටහනක් ලෙස අනාවරණය කර තිබුණි. තවද, පොළී හා බැඳීම් ගාස්තූන් වෙන් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිසි යාන්ත්‍රණයක් නොමැති වීම. | මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් යුතුව නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. සමාලෝචිත වර්ෂය අවසානයේදී උපයෝජනය කරන ලද ණය ප්‍රමාණය පෙන්විය හැකි පරිදි අදාල පිරිවැය වෙන්කර ගිණුම්වලට ගත යුතුය |
| (ආ) | ණය ලබාදෙන නියෝජිතායතනය විසින් සිදු කරන ලද එ.ජ.ඩො. 27,340 කට සමාන රු.මිලියන 4.92 ක සෘජු ගෙවීම් මූල්‍ය ප්‍රකාශනයට ගෙන නොතිබුණි. | කෙරීගෙන යන වැඩ සහ ලැබී ඇති ණය අඩුවෙන් දැක්වීම් | නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ | ණය නියෝජිතායතනයෙන් ලැබුණු තොරතුරු සමඟ සැසඳීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙවීම් කරන ලද එකතුව රු. | රජයෙන් ලැබුණු | අදහස් දක්වා නොමැත | මහා භාණ්ඩාගාරයේ වාර්තා සමඟ |

| | | | | |
|---|---|---|---|---|
| | මිලියන 182.41 ක් වූ එකතු කළ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වයට එරෙහිව හිලව් කර තිබුණි | දායකත්වය අඩුවෙන් දැක්වීම් | | සැසඳිය හැකි පරිදි ශ්‍රී ලංකා රජයෙන් ලද මුළු දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කළ යුතුය. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව වැඩසටහන වෙනුවෙන් කරන ලද මුළු බෙදාහැරීමේ වටිනාකම වන රු.මිලියන 215.39 වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශනයෙහි නිරූපණය වන රු.මිලියන 217.14 ක වටිනාකම සමඟ එකඟ වී නොතිබුණි. | ශේෂයන් නොසැසඳේ. | භාණ්ඩාගාරයේ වාර්තා යාවත්කාලීන කිරීමට කාලයක් ගැනීම හේතුවෙන් පවතින විනිමය අනුපාත පදනම් කරගෙන ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ වාර්තා යාවත්කාලීන කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර මහා භාණ්ඩාගාරය තොරතුරු සමඟ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ ඇති සංඛ්‍යා කාලීනව සැසඳීම් කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අනු අංකය | නීති, රීති සහ රෙගුලාසි සඳහා යොමුව | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවලට අනුව සහතික කළ බිල්පත් දින 56 ක් ඇතුලත පියවීම් කළ යුතු විය. කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 දිනට බිල්පත් පියවීම ප්‍රමාදවීම නිසා කොන්ත්‍රාත්කරු විසින් එ.ජ.ඩො. 78,934 ක් සහ රු. මිලියන 19.67 ක අතිරේක මූල්‍ය ගාස්තු ලෙස ඉල්ලීම් කර තිබුණි. | දුර්වල මූල්‍ය කළමනාකරණය | අදහස් දක්වා නොමැත | නියමිත දිනට බිල්පත් පියවීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ඡේදයේ විධිවිධානවලට පටහැනිව පුහුණු මධ්‍යස්ථානය සඳහා නේවාසිකාගාරය සහ ආපන ශාලාවෙහි ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් අත්සන් කර තිබුණි. | අත්සන් තබන ලද ලේඛනවල නීත්‍යානුකූලභාවය සැකසහිත වේ. | *අදහස් දක්වා නොමැත* | රු. මිලියන 500 හෝ ඊට වැඩි වටිනාකමකින් යුතු කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කළ යුතුවේ. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

කොළඹ නගරයේ බටහිර සහ දකුණු ප්‍රදේශයන්හි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය, මහරගම සහ පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම හා ඉදිකිරීමේ කාර්යයන්, මධ්‍යම පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණ කටයුතු, එලි හවුස් ජලාශ පරිශ්‍රයේ යෝජිත පොම්පාගාරයේ සිවිල් වැඩ යනාදි සංරචක යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ.

**මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කෙරේ**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| කලාප මැනුම් ප්‍රදේශ 23ක් තුල මීටර් 206,166 ක නළ එලීම් සහ නිවාස ඒකක 33,236 කට ජල සම්බන්ධතා සැපයීම සඳහා 2017 ජනවාරි 10 වන දින ප්‍රදානය කරන ලද සහ 2021 ජූනි මස වන විට නිම කිරීමට සැලසුම් කරන ලද කොළඹ නගරයේ දකුණු කලාපයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින ට අඩු ප්‍රගතියක් නිරූපණය විය. තවද, කොළඹ නගරයේ බටහිර කලාපයේ ආදායම් නොලබන ජලය අඩු කිරීමට සඳහා සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 23 නිමකිරීමට සැලසුම් කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට කලාප මැනුම් ප්‍රදේශ 18 ක නල එලීම් 117,915 න් මීටර් 29,993 ක් නල එලීම්ද, සම්බන්ධතා මාරුකිරීම් 29,343 ක ප්‍රමාණයකින් සම්බන්ධතා 36 ක් පමණක් නිම කර තිබුණි. ඉහත සඳහන් වැඩවල ප්‍රමාදවීමට මාර්ග වැඩ කටයුතු සඳහා කොළඹ නගර සභාවේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතීන් ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වීම. යන්ත්‍රෝපකරණ වෙනුවට මිනිස් ශ්‍රමය යොදා ගැනීම සහ අනපේක්ෂිත ලෙස භූමියේ උපයෝගිතා හමුවීම යනාදිය හේතු විය. එබැවින් 2018 දෙසැම්බර් 31 දිනට කොළඹ දකුණ කලාපයේ නළ එලීම් මීටර් 32,352 ක් සහ නිවාස ඒකක 1,346 ක ජල සම්බන්ධතා සැපයීම් පමණක් සම්පූර්ණ කර තිබුණි. තවද අනෙකුත් කලාප | කොන්ත්‍රාත්තු නිම කිරීමට ප්‍රමාද වීමේ හැකියාව | කොන්ත්‍රාත් කටයුතු කඩිනමින් කිරීමට පියවර ගෙන ඇත | නියමිත කාලයට වැඩ නිමකිරීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවිය යුතු අතර නිරීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට අවශ්‍ය වේ. |

මැනුම් ප්‍රදේශ වල වැඩකටයුතු සඳහා මූලිකත්වය දීම හේතුවෙන්, කොළඹ නගරයේ දකුණ ප්‍රදේශයේ කලාප මැනුම් ප්‍රදේශ 11 ක මීටර් 99,021 ක නල එලීම් කටයුතුද, කොළඹ නගරයේ බටහිර කලාප මැනුම් ප්‍රදේශවල මීටර් 5,139 ක නල එලීම් කටයුතු 2019 මැයි 15 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.2 සම්පත් ඌණ උපයෝජනය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| අනු අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති මුළු කාලපරිච්ඡේදය වන මාස 60 න් මාස 54 ක් ඉක්ම ගියද ණය නියෝජිතායතනය විසින් ලබාදෙනු ලබන එ.ජ.ඩො. මිලියන 79.95 ට සමාන රු.මිලියන 10,394 ක් වන මුළු ප්‍රතිපාදනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය එ.ජ.ඩො.මිලියන 18.45 කට සමාන රු.මිලියන 4,053.51 ක් නියෝජනය වන සියයට 23.07 ක් විය. | බැඳීම් ගාස්තු අයකර ගැනීමේ සම්භාවිතාව | ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීම නිසා වසර 04 ක කාලපරිච්ඡේදයක් සහිතව ප්‍රධාන කොන්ත්‍රාත්තුන් 2017 දී ආරම්භ කර තිබුණි. එම නිසා 2021 දක්වා වියදම් බෙදාහැරීම් සිදු කිරීම් දීර්ඝ වේ. | වැඩ කඩිනම් කිරීම සඳහා පියවර ගතයුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව සුපරීක්ෂණය කළ යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය මඟින් 2015 සැප්තැම්බර් 02 දින නාගරික සංවර්ධන අධිකාරියට ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 10 ක අත්තිකාරමක් ලබා දී තිබුණි. පසුව යෝජිත ඉඩම 2017 අගෝස්තු වන විට මූලික අත්තිකාරම පිළිබඳ සැලකිල්ලකින් තොරව කොළඹ මහ නගර සභාව වෙත පවරා දී තිබුණි. කෙසේ වෙතත් 2019 අප්‍රේල් 30 දක්වාම අත්තිකාරම් අපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුදල් වසර 03 ක් පුරා නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණි. | අදහස් දක්වා නොමැත | සාධාරණ පොලියක් සහිතව අත්තිකාරම් නැවත අයකර ගැනීමට පියවර ගත යුතුය. |